GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2017.07.27

**මාධ්‍ය නිවේදනය**

ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යනු වෛද්‍ය සේවාවේ ප්‍රමිතිය හා වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය නියාමනය, රෝගී අයිතිවාසිකම් සුරැකීම සඳහා ඇති ව්‍යවස්ථාපිත, ස්වාධීන ආයතනයකි.

වෛද්‍ය අධ්‍යාපනයේ සහ වෛද්‍යවරුන්ගේ ගුණාත්මකභාවය රැකගැනිම සහ ලෝක සම්මතය ආරක්ෂා කිරීම වෛද්‍ය සභාවේ ද රජයේ ද මුලික වගකිමකි.

නමුත් අද වන විට මෙම ලෝක සම්මතය බිඳ වැටිම සහ වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තර්ජනයට ලක් වීමක් සයිටම් අර්බුදය තුලින් අපිට පෙනෙන්ට ඇත.

සුළු පිරිසකගේ අක්‍රමවත් හා අසම්මත ක්‍රියා තුලින් රෝගීන්ගේ ආරක්ෂාවත් වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතියත් සහමුලින්ම බිඳවැටීමට පටන් ගෙන ඇත. එයට රුකුල් දෙන සහ මෙම අසම්මත ක්‍රියා සඳහා කැපවුණු සහ දේශපාලන වියරුවෙන් ක්‍රියා කරන අමාත්‍යවරුන් කිහිපදෙනෙකු ශ්‍රී ලංකාවේ පහල විම ජාතියේම අවාසනාවකි.

එය තවත් තහවුරු කරමින් දුම්කොළ සමාගමක අධ්‍යක්ෂවරයෙකු නෙවිල් ප්‍රනාන්දු රෝහලේ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කර ඇත. එය ලෝක සම්මතය අමු අමුවේ උල්ලංඝණය කිරීමකි. තවදුරටත් රෝගී අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමටත් රජය අපකීර්තියට හා අපහසුතාවයට පත් කිරීමටත් ගත් උත්සාහයක් ලෙස අපි දකිමු.

වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය සම්බන්ධව රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය ගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා සමඟ සාකච්ඡා පැවැත්වෙන අතරතුර මෙවැනි ක්‍රියාවක් සිදු කිරීම තුලින් සෞඛ්‍ය අමාත්‍යවරයාගේ අරමුණ හොඳින්ම පැහැදිලි වේ. මෙය එම සාකච්ඡාවන් අර්ථ ශූන්‍ය කිරීමට වෙර දැරිමකි. මෙවැනි දේශපාලනිකව වියරු වැටුණු අමාත්‍යවරුන් සමඟ කටයුතු කිරීම තවදුරටත් කාලය කා දැමීමක් හා අර්ථ විරහිත කටයුත්තක් බව සාමාජිකත්වයේ අදහසයි.

එබැවින් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය විධායක සභාව අද දින තුල වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතිය පිළිබඳ වන සාකච්ඡා වලින් ඉවත් වීමට තීරණය කර ඇත. මන්ද යත් අවසානයේදි තනි පුද්ගලයෙකුගේ ක්‍රියාකාරකම් තුලින් සියල්ල කණපිට හැරෙන බව මේ වන විට ඔප්පු වි ඇති නිසාය.

අද දින තුල එකඟතාවයන්ට අනුව අත්අඩංගුවේ සිටින විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අදාල නිත්‍යානූකූල ක්‍රියාමාර්ග අනුගමනය කොට නිදහස් වීමට නියමිතව තිබිණි. අප වෙත දැනගන්නට ලැබි ඇති පරිදි නීතිපතිවරයා අද දින උසාවිය හමුවේ පෙනි නොසිටීම හේතුවෙන් සියලු එකඟතා බිඳ වැටි ඇත. මෙය ඉතා අවාසනාවන්ත තත්ත්වයකි. ගරු අග්‍රාමාත්‍යතුමාගේ උත්සාහය පවා පරාජය කිරීමකි. මේ පිළිබඳ අපගේ දැඩි අප්‍රසාදය පළ කරන අතර සමස්ථ සාකච්ඡාමය ක්‍රියාමාර්ගය සඳහා මේ තුලින් එල්ල වු ඍණාත්මක බලපෑම සුළුවෙන් තැකිය නොහැක.

ව්‍යාජ විසඳුම් වෙනුවට අමාත්‍යවරුන් සත්‍ය විසඳුම් සඳහා අවංක කටයුතු කිරීමේ අවශ්‍යතාවය අපි දැඩි සේ අපේක්ෂා කරමු. ඇමතිවරුන්ගේ දේශපාලන වියරුව තුලින් රෝගී ජිවිත සුරක්ෂිතතාවයට හානි සිදුවීමට අප කිසිසේත් ඉඩ නොතියන බව අවධාරණය කරන්නෙමු.

ස්තුතියි.

වෛද්‍ය හරිත අලුත්ගේ
ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර : | වෛද්‍ය සමන්ත ආනන්ද | - 0777666301 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - 0717876516 |
| | වෛද්‍ය ප්‍රසාද් රණවීර | - 0773527476 |
| | වෛද්‍ය ප්‍රසාද් කොළඹගේ | - 0716812160 |
| | වෛද්‍ය ටි ගාන්දීපන් | - 0777755035 |